# කළේ කරුමේ

පුළුලූකුලේ නුඹ කුඹ ගෙනියන්නද
නැගනියනේ කියපන්
තරිකිට නැගනියනේ කියපන්
නැගනියනේ කියපන්
තරිකිට නැගනියනේ කියපන්

පිරුනු කළේ පැන් නොසැලෙන්නාසේ මැයි
ඒ රුව නොදුටුවෙ නුඹගේ දෙනුවන් මැයි

අඩම්බරයක් හිතුනද මන්දා
නැගනියනේ කියපන්
තරිකිට නැගනියනේ කියපන්

ලැමවිල ඉපදුන හස යුවලත්
කළයේ පැන් වෙත එබී බලයි
උන් පවසින් බව නොම විමසා
දෙවැට දිගේ යන මටද පෙනේ

සබකෝලයකුත් මතුවී එනවද
නැගනියනේ කියපන්
තරිකිට නැගනියනේ කියපන්

විකුම්
March 18, 2001

©2001 by author. This work may be printed and/or distributed **freely** provided this statement is intact. However, this work may not be produced commercially or included in *any media that is sold to the public* without written permission from the author. It may be used as lyrics or associated with any other form of artwork, provided proper and customary credits are given.